# ශාස්ත්‍රපති පාඨමාලාව
# (ජනසන්නිවේදනය)

සන්නිවේදන ශාස්ත්‍රපති පාඨමාලාව ප්‍රශ්න පත්‍ර 05කින් හා පර්යේෂණ නිබන්ධනයකින් යුක්ත වේ. MACO 53015 සිට MACO 53065 දක්වා අනිවාර්ය වේ.

MACO 53015 සන්නිවේදන මූලධර්ම
Principles of Communication

MACO 53025 ජනමාධ්‍ය ඉතිහාසය
History of Media

MACO 53035 භාෂාව හා නිර්මාණාත්මක සන්නිවේදනය
Language and creative Communication

MACO 53045 සංවර්ධන සන්නිවේදනය සහ ජනමාධ්‍ය භාවිතය
Development Communication and Media Usage

MACO 53065 ජනසන්නිවේදන පර්යේෂණ ක්‍රම
Mass Communication Research

MACO 53075 පර්යේෂණ නිබන්ධය
Dissertation

## MACO 53015 සන්නිවේදන මූලධර්ම
## Principles of Communication

ජනසන්නිවේදනයේ ජීව විද්‍යාත්මක, මානව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක පදනමත් මානව සමාජ පරිණාමයත් සමඟ සන්නිවේදනය බවට පත් වූ සිද්ධාන්ත පිළිබඳව අධ්‍යයනය මෙහි අරමුණයි.

මානව සන්නිවේදනයේ විශේෂතා
සන්නිවේදන ආකෘති
සංකල්ප,
සිද්ධාන්ත,
ජනමාධ්‍ය හා සමාජ ප්‍රවණතා
ජනසන්නිවේදනයේ සමාජ විද්‍යාත්මක ගැටලු,
දේශපාලනය හා සන්නිවේදනය,
සන්නිවේදන කළමනාකරණය

යනාදී ක්ෂේත්‍රයන්හි න්‍යායාත්මක අවබෝධයක් ලබා දීම මෙහි අරමුණ වේ.

## MACO 53025 ජනමාධ්‍ය ඉතිහාසය
## History of Media

ලෝක සන්නිවේදන ඉතිහාසයේ ලිඛිත - ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍යයන්ගේ ප්‍රභවය හා විකාශය මානව ශිෂ්ඨාචාරයේ ඉතිහාසය හා අවියෝජනීයව වර්තමානය දක්වා වර්ධනය වී ඇති ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි.

සන්නිවේදන තාක්ෂණයේ විකාශය
පුවත්පත්, ගුවන්විදුලිය, චිත්‍රපට හා අවශේෂ මාධ්‍ය ප්‍රභවයේ සිට විකාශය දක්වා බලපෑ ඓතිහාසික, සමාජික, ආර්ථික, ආගමික හා දේශපාලන පසුබිම

පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි පරමාර්ථය වේ. (දේශීය ජනමාධ්‍ය ඉතිහාසය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.)

## MACO 53035 භාෂාව හා නිර්මාණාත්මක සන්නිවේදනය
## Language and Creative Communication

මානව භාෂාවේ ප්‍රභවය හා පරිණාමයත්, සන්නිවේදනය සඳහා භාෂාව ඉවහල් වන ආකාරය හා භාවිතයත්, භාෂාත්මක සන්නිවේදනයේ ප්‍රබලත්වය ගැනත් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ.

භාෂාව හා සමාජය,
ජනමතය හා භාෂා භාවිතය හා ප්‍රචාරය,
ජනවිඥානය හඳුනා ගැනීම,
භාෂා භාවිතයේ ස්වරූපය,
රංග කළා,
ජනමාධ්‍ය විශේෂාංග නිර්මාණකරණය,
නව නිර්මාණ ප්‍රවණතා හා ජනප්‍රිය සංස්කෘතිය

යන ක්ෂේත්‍ර පදනම් කරගෙන භාෂාව හා නිර්මාණකරණය යනාදිය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙහිදී අපේක්ෂා කෙරේ.

## MACO 53045 සංවර්ධන සන්නිවේදනය සහ ජනමාධ්‍ය භාවිතය
## Development Communication and Media Usage

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ මතවාද ආකෘති හා නව අත්දැකීම් යනාදියත් ජනමාධ්‍ය භාවිතයට ගතයුතු ආකාරය හැදෑරීමත් මෙහි අරමුණකි.

සාම්ප්‍රදායික මාධ්‍ය හා ආකෘති,
සංවර්ධන කලාප,
සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධන ගැටලු,
පරිසර සන්නිවේදනය,
ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්ෂේත්‍රයේදී ජනමාධ්‍ය භාවිතයේ ප්‍රබලතා හා දුබලතා,
ග්‍රාමීය සන්නිවේදනයට උචිත සන්නිවේදන විධි ක්‍රම,
සංවර්ධන සමීක්ෂණ සැලසුම්

යනාදිය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහිදී අදහස් කෙරේ.

## MACO 53065 ජනසන්නිවේදන පර්යේෂණ ක්‍රම
## Mass Communication Research

සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට පර්යේෂණ විධික්‍රම වල ඇති අවශ්‍යතාව. මාධ්‍ය පාලනය, සංදේශ විශ්ලේෂණය හා ග්‍රාහක චර්යා අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි.

සමාජ විද්‍යා, මානව විද්‍යා, පර්යේෂණ ක්‍රම වලට අදාළ න්‍යායික අවබෝධය
පුස්තකාල භාවිතය,
නියැදි ක්‍රම,
ක්ෂේත්‍ර සමීක්ෂණ ප්‍රවණතා හා මූලික සංඛ්‍යානය

පිළිබඳව අවබෝධයක් ලබා දීම මෙහි පරමාර්ථයයි.

## MACO 53075 පර්යේෂණ නිබන්ධය
## Dissertation

සන්නිවේදන ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවක් යටතේ වචන 8000 -10 000 අතර පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම.

මේ සඳහා උපදේශකවරයෙකු අධ්‍යයනාංශයෙන් පත් කරනු ලබන අතර විභාගය අවසන් වී මාස 03ක් ඇතුලත නිබන්ධය භාර දිය යුතුය.